බොන්න හදනා හැටි

හවුල් කැඳ

ඊට පස්සෙ මම ඇතුළු නවදෙනෙක් පත්තරෙන් අස්වෙන්න තීරණය කළා. තව හිටියා අස්වෙන්න කට්ටිය. ඒත් අන්තිම මොහොතෙ සමහරු මගහැරියා. අපි අස් වෙලා ටික දවසකින් 64 දෙසැ. 18 එච්.ජී.එස්. රත්නවීරගේ කර්තෘත්වයෙන් 'ඇත්ත' පතත්රේ පටන් ගත්තා. මමයි, හේම ද සිල්වයි, පියසේන ගුණවර්ධනයි තමයි මුලින්ම ඇත්තට සම්බන්ධ වුණේ. පත්තරේ පිටු හතරයි. ඇත්තටම ඇත්ත මට ගැලපුණා.

**ගැලපුණා කිව්වෙ?**

දේශපාලන මතය අනුවත් හරි. හොඳ පඩියකුත් ලැබුණා. ඒ කාලෙ ඉතින් කොමියුනිස්ට් පක්ෂයට රුසියාවෙන් ආධාර ලැබුණනෙ. අපට අඩුපාඩුවක් තිබුණේ නැහැ.

**රංචාගොඩ ළමයාගේ ස්වරූපයෙන් කවි ලිවීම ඇරඹුණේ කොහොමද?**

මෙහෙව් රටේ රංචාගොඩ ඉපදීලා

රුහුණු රටට මාදීලා ඉලව්වේ

දෙමට පොතු කකා කට හම යන්නාවේ

හැම දෙවියනේ මගෙ වාහේ රකෝ රකෝ...

රංචාගොඩ ළමයාගේ මේ කවිය තමයි මගේ නිර්මාණවලට බලපෑවේ. රංචාගොඩ ළමයා අවසාන පදයෙන් ගන්නා උත්ප්‍රාසය මම සමකාලීන දේශපාලන සිදුවීම් ගැන ලියන්න භාවිත කළා. ඒ සමගම කෝසල රජගෙ අලුත් සිහින කියන විශේෂාංගය ලිව්වා. සිරිමා පැරදිලා හත්හවුලක් එක්ක ඩඩ්ලි අගමැති වුණාම මම ලිව්වා හත්හවුල් කවිමඩුව කියලා විශේෂාංගයක්. මූලාසනේ ඉන්න ඩඩ්ලි කවියක් කියනවා. අනෙක් ඇමතිවරුන් එකිනෙකා නැගිට කවි කියනවා. අවසානයේදී ඔවුන්ම උපහාසයට ලක්වෙනවා. ඒ කාලෙ තිබුණු දෙමළ භාෂාවටත් තැනක් දීමේ දෙමළ භාෂා විධි විධාන පනතට සමහරු විරුද්ධව උද්ඝෝෂණ කළා. එහිදී දෙමළ අයටත් ලංකාවේ අතීතයට ලොකු සම්බන්ධයක් තිබුණු බව හෙළිකරන්න මම 'මහාවංස විමංසන' කියන විශේෂාංගය ලිව්වා.

**ඔබ මධු පානයත් එක්ක ජීවිතේ තදින් සම්බන්ධ කරගත්ත කෙනෙක් පංසලේ ඉඳල මේ නැඹුරුව ඇතිවුනේ කොහොමද?**

මමත් බොන්න ඕනෙ කියලා කවදාවත්ම මම හිතුවේ නෑ. මට සිංහල සාහිත්‍යයේ මෙන්ම වෙනත් සාහිත්‍යයන්ගෙන් ගණිකාවන් ගැන කියවන්න ලැබෙනවා. ඉතින් මට යම් ආසාවක් තිබුණා කොළඹ ඇවිත් ගණිකාවක් ඇසුරු කර බලන්න ඕනෙ කියලා. ඒත් ඒකට යොමුවෙන්න කලින් මං බීමට යොමවුණා. මුලින්ම මං අඩියක් ගැහුවෙ සිංහල ජාතියෙ ගෞතමදාස මහත්තයගෙ කාමරේදි. මුලින්ම අරක්කු කට ගාපු දවසෙ මට ඒක හරියට රස වැටුණා. අදටත් ඒ රසයම දැනෙනවා. සිංහල ලේඛක සංගමය කියන එකේ මාත් හිටියා. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ , වී.ඩී. ද ලැනරෝල් වගේ අයත් එක්ක මම ඒ කාලෙ ඇසුරට වැටුණා. ලැනරෝල් පුදුම බීමක්නෙ බොන්නෙ. එයාට වයස 60 පිරීම නිමිත්තෙන් තිබුණු පාටියට මටත් ආරාධනා කරලා තිබුණා. අපි හවස එයාගෙ ගෙදර යනකොට මිනිස්සු ඉස්තෝප්පුව ගාව ඉඳන් ගෙට නොයා බලන් ඉන්නවා. මම කිට්ටුවෙලා බලන කොට ලැනරෝල් මහත්තයා නිදි. මොකද දන්නවද වෙලා තියෙන්නෙ. අපි හවස එනතුරු ඉන්න බැරිව මෙයා උදේ ඉඳලම ගහලා වෙරි. ගෙදර අය අපිට පේන්න ලැනරෝල්ව තියල කොහාට හරි මගඇරලා ගිහිල්ලා. මානවසිංහ මහත්තයත් පාටියට ඇවිත් හිටියා. එයා මාවයි තව කෙනෙකුයි ඇදගෙන පිටිපස්සෙන් ගෙට ගියා. මෙන්න බොලේ කාමරේක අරක්කු බෝතල් පුරවලා. අප තුන්දෙනා බඹර පදං වෙන්න ගහලා පිටිපස්සෙන්ම යන්න ගියා.

ඔන්න මං එක කාලයක් මරදානෙ නැවතිලා හිටියා. මානවසිංහ මහත්තයා ට්‍රෑම් කාර් එකක ඇවිත් මරදාන හන්දියේ මං ඉන්නවා දැකලා බැස්සා. ලාල් යං ද මාරිඅම්මා කෝවිල පැත්තේ කියලා එයා ඇහුවා. මට හරි පුදුමයි මෙයා කෝවිල් යනවද කියලා. මමත් යං කියලා ඊළඟ ට්‍රෑම් එකේ නැගලා ගිහින් කොටහේනෙ බැස්සා. දැන් දෙන්නා ලේන් එකක යනවා. මාරිඅම්මා කෝවිලත් පහුවුණා. තව ටිකක් දුර ගිහින් මානවසිංහ මාවත් ඇදගෙන පුංචි ගේකට රිංගුවා. පුටුවක වාඩිවෙන ගමන් මාරී .. කියලා කාටද අඬ ගැහුවා. මෙන්න කොට මහත ගෑනු පරාණයක් එළියට ආවා. බැලින්නම් ඒක තැබෑරුමක්. මාරි අයිතිකාරි.

**දැන් ඔය බීමත් එක්ක ගණිකාවන් ආශ්‍රය කරන්න හිතපු අදහස යට ගියාද?**

ඒ වැඩේදි මම හුඟක් දුර ගියේ නැහැ. හැබැයි ටිකක් දුර ගියා. ගෑනු කීප දෙනෙක් ආශ්‍රය කරලා බැලුවා. ඒකෙ යම් අලුත් ආශ්වාදයක් නැහැ කියන්න බැහැ. ඒ වුණාට ගෑනුන්ට වඩා මං බීමට තමයි කැමතියි. උදේට කන්තෝරුවට ගෙනල්ලත් බොනවා. බයිට් සැන්ඩි ඕනෙ නැහැ. බිව්වයි කියලා ඒක වැඩට බාධාවක් කරගත්තේ නැහැ.

**ඔබේ බිරිඳ හමුවුණේ කොහොමද කියලා මට අහන්න අමතක වුණානේ?**

ආ. ඒක තමයි මට කියන්න බැරිවුණා. වැලිගම සුමංගල හා සිද්ධාර්ථ විද්‍යාලවල සිසු සිසුවියන් සඟරාවක් කළා. මේක අච්චු ගැහුවෙ නැහැ. අතින් තමා ලිව්වෙ. හස්ත මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී කියල ඒකෙ යටින් අපි ලියනවා. මමත් ඒ කාලෙ වැලිගම තරුණ කවියෙක් හැටියට මේකට සම්බන්ධ වෙලා හිටියා. මම අනුලාට යෝජනා කළා අපි කවි සංවාදයක් කරමු කියලා. මම සුළඟ. එයා සුවඳ. මම සංවාදය ආරම්භ කරමින් සුළඟ නමින් කවියක් ලිව්වා සුළඟ විසින් සුවඳ ගහගෙන යනවා කියලා. නමුත් අනුලා ඊළඟ සඟරාවට උත්තර ලිව්වෙ නැහැ, හැබැයි මට උත්තර ලිව්වා. ඒ පාර සුළඟ විසින් සුවඳ ගහගෙන ගියා.

**රුසියාවට ගිය අවස්ථාවල රුසියානු තරුණියන්ට හිත ගියේ නැද්ද්?**

නැත්තෙ මොකෝ. හිත ගියා. ඒත් ඉතිං වොඩ්කාවලට ඊටත් වඩා මගෙ හිත ගියානෙ.

**(2009 මාර්තු මස 01 දා රාවය පුවත්පතේ පළවූවකි.)**

Sanka Law Professional Corporation



"Cost effective legal advice in a timely manner"

- Real Estate
- Family Law
- Wills, Powers of Attorney and Estates
- Business Law
- Notary Public Services

Sanka Wijeratne, LL.B.
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

OFFICE

50 Nashdene Road
Unit 104
Toronto ,ON M1V 5J2

Tel: 416-494-9183
Fax 1 866 494 9389

E mail : info@sankalaw.com Web : http://www.sankalaw.com

Services are available in Sinhala, Tamil (by appointment only) and English. Evening and weekend appointments are available.